# ප්‍රභාමත් හෙට දිනට පායනා අරුණැල්ල
# කිණිහිර

අපගේ සමාජය තුළ පිරිහී යන මනුෂ්‍යත්වය සහ සාමූහිකත්වය යලි විකසිත කිරීම සඳහා කුඩා හෝ දායකත්වයක් අප විසින් සිදු කළ යුතු යැයි විශ්වාස කරනු ලැබූ තරුණ තරුණියන් කිහිප දෙනෙකුගේ සිත තුළ අධ්‍යයන කවයක් සහ සමාජ ක්‍රියාකාරීත්වයක් පිළිබඳ බලාපොරොත්තුව තුළින් කිණිහිර අධ්‍යයන කවය ආරම්භ වීය . එය මුලින්ම



ආරම්භ වූයේ ගාල්ල නගරය සහ දකුණු පළාත කෙන්ද්‍ර කරගත් තරුණ තරුණියන් පිරිසකගේ දායකත්වයෙන් වුවද  අද වන විට එය වටා මුළු රටම නියෝජනය කරන දහස් ගණනක බාල තරුණ මහලු මෙන්ම සමාජයේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පිරිස් එකතු වී සිටී.

සංවිධානය මුලින්ම ආරම්භ වූයේ 2007 වර්ෂයේදීය. ඒ කලා ක්ෂේත්‍රය පදනම් කරගෙනය. 2007 තිණිහිර කලා උළෙල මතින් අප අපගේ සමාජ



ක්‍රියාකාරීත්වය ආරම්භ කළෙමු. එතැන් සිට අඛණ්ඩව කලා උළෙලවල් මෙන්ම කලා ක්ෂේත්‍රයට අදාලව මෙන්ම ඉන් ඔබ්බටද අපගේ ක්‍රියාකාරීත්වය ව්‍යාප්ත කිරීමට අප සමත්ව සිටින්නෙමු. ඒ වටිනා පොත් ප්‍රදර්ශණයන්, නාට්‍ය ප්‍රදර්ශණ, චිත්‍රපට සහ ප්‍රසංග, රසවින්දනාත්මක වැඩ සටහන් සහෘද සහ පාඨක එකතු සහ සංවාද ගුණදාස කපුගේ සූරීන්ගේ සමරුව සහ ප්‍රසාංගය මෙන්ම විකල්ප කලා ප්‍රසංග සහ වැඩ සටහන්, පොත් පත් ප්‍රකාශණය මෙන්ම සමාජය තුළ මිනිසුන් පීඩනයට පත් කරන විවිධ සමාජ අගතීන්ට එරෙහිව සමාජය සමග එක් ව කරන ව්‍යවහාර, අභ්‍යාස සමග බැදුණු දැනුවත් කිරීම් ආදියත් එයට අයත්ය. ඒ අතර ජ්‍යොතිෂ්‍ය ආගම සහ දර්ශණයන්ගේ හරය පිළිබඳ සංවාදයන් සහ සම්මන්ත්‍රණයන්ද අප දියත් කළෙමු.

සෑම වසරකම ගීත රචනය, ගායනය මෙන්ම චිත්‍ර, මූර්ති, නාට්‍ය ආදී නිර්මාණ ක්ෂේත්‍රයන්හි ප්‍රභාවක් දක්වන පිරිස් හඳුනාගෙන ඒ අය සමාජ මෙහෙවරකට එක්කර ගැනීමට අපි කටයුතු කරමින් සිටින්නෙමු. ප්‍රකාශණ ක්ෂේත්‍රය තුළද ඉතාමත්ම වටිනා පොත්පත් රාශියක් අපි ප්‍රකාශයට පත් කළෙමු. ප්‍රවීණ ගීත රචකයෙකු සහ කවියෙකු වන රත්න ශ්‍රී විජේසිංහ මහතාගේ ආලකමන්දා සහ සැලලිහිණියෝ යන කාව්‍ය ග්‍රන්ථ දෙකද ප්‍රකාශයට පත් කළෙමු. රුසියානු ළමා කතාවන් වන අළුත් පාලමේ කතාව ඇතුළු ග්‍රන්ථ කිහිපයක්ද අපි ප්‍රකාශයට පත් කළෙමු.

වැදගත් දාර්ශණික පොත්පත් ලෙස අප හඳුනාගන්නා ලද ක්වොන්ටම් ලෝකයේ දයලෙක්තිකය පොත මෙන්ම දර්ශණයට අදාළ රුසියානු කෘතියක් වන මිනිසාගේ සමත්කම් කෘතියද පසුගිය වසරේදී අප නැවත එළි දැක්-වූයෙමු. එසේම ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ගැටළුව හෙළිදරව් කරන විළංගු ලූ අකුරු කෘතිය නැවත ප්‍රකාශයට පත් කිරීම රට තුළ බො-හෝ කතා බහට ලක් විය. ලංකාව තුළදී අධ්‍යයන ක්ෂේත්‍රයට, දාර්ශණික ක්ෂේත්‍රයට මෙන්ම යහපත් සමාජයක් ගොඩනැගීමට උදවුවන කෘතීන් ජනතාව අතට අඩුම මිලකට පත් කිරීම අරමුණ කර ගනිමින් සෑම වසරකම අඩුම මිලට පොත් ලබා දෙන පොත් ප්‍රදර්ශණ කිහිපයක් අපි පවත්වමින් සිටින්නෙමු.

එසේම සමාජයට ඉතාමත් බලපෑමක් ඇති කිරීමට මෙන්ම සාමූහික රසවින්දනයට සමාජය යොමු කිරීමට උදව් වේ යැයි අප විසින් හඳුනාගන්නා ලද නාට්‍ය රාශියක් වේදිකාගත කිරීමට සෑම වසරකම අපි ක්‍රියා කරන්නෙමු.

ඇමරිකානු ජාතික නාට්‍යවේදියෙකුගේ  නාට්‍යයක පරිවර්තනයක් වන 12 සහ ඉතාලි ජාතික නාට්‍ය-වේදියෙකු වන දාරියෝ ෆෝ ගේ ඇ ජ්බළු චීහ ඇ ඒබළු චීහ නාට්‍යයේ සිංහල පරිවර්තනය වන හොරුත් එක්ක බොරු නාට්‍ය ප්‍රදර්ශණය කිරීමට කටයුතු කළේ මේ වසරේදීය. හොරුත් එක්ක බොරු නාට්‍යය 2013 සැප්තැම්බර් මාසයේදී අප විසින් ගාලු නගරයේදී ප්‍රදර්ශණය කළෙමු. එසේම සෑම වසරකදීම කිනිහිර සහෘද සහ පාඨක එකතුව සමග එක් වෙමින් චිත්‍රපට ගීත රසවින්දන සහ විචාරක වැඩසටහන් පවත්වමින් සිටිමු. ගුණදාස කපුගේ සූරින්ගේ කලා භාවිතය සමාජගත කිරීමේ අරමුණින් කපුගේ සමරුව සහ ප්‍රසංගය සෑම වරසකදීම අප පවත්වන ලද අතර මේ වසරේ අප්‍රේල් මාසයේදීද පැවැත්වූයෙමු. එසේම ඉතාමත්




දුෂ්කර ප්‍රදේශවල ළමා සමාජ පාසල් පුස්තකාල සහ වෙනත් පුස්තකාල සඳහා පොත්පත් ලබාදීම, සංගීත සහ වෙනත් අත්‍යවශ්‍ය උපකරණ ලබාදීම මෙන්ම පාසල් සහ පුස්තකාල පාඨක සමාජයන් මූලික කරගනිමින් අප ක්‍රියාත්මක වන ක්ෂේත්‍රයන්ට අදාලව සම්මන්ත්‍රණ වැඩමුළු සහ ක්‍රියාකාරීත්වයන් පැවැත්වීම අඛණ්ඩව සිදුකරමින් සිටින්නෙමු.

මේ සඳහා අපට ධෛර්ය ශක්තිය සපයනුයේ දේශීය සහ විශේෂයෙන් විදේශීයව සිටින ශ්‍රී ලාංකීය හිතවතුන් සහ සංවිධානයි. එහිදී ඕස්ට්‍රේලියාවේ විකසිත කලාකවය අපට වැඩිම දායකත්වය සපයන ලද සංවිධානයයි. අප සතු දහස් ගණනක සාමාජිකත්වය මේ කාර්ය සිදුකර ගැනීමට අවශ්‍ය බලය ශක්තිය මෙන්ම ධෛර්යය අවශ්‍ය තරම් සපයන නමුදු අප මුහුණ දෙන ප්‍රධානම ගැටලු කිහිපයකි. අප ජීවත්වන සමාජය තුළ යමක් කිරීමට ආරම්භ කිරීමේදී අප මුහුණ දෙන ප්‍රධානම ප්‍රශ්නය වන්නේ ඊට අදාළ සම්පත් සහ මූල්‍යමය දායකත්වය සොයා ගැනීම පිළිබඳ ප්‍රශ්නයයි. එහිදී විකසිත කලා කවය අපගේ ප්‍රධානම අත්වැලයි. එය නොවන්නට කිණිහිර මෙතරම් දිගු ගමනක් නොඑනු ඇත.

## Young athlete makes his State debut



By Themal Mendis

BECOMING a competitor of athletics on the state level is a fantastic achievement in itself, however to win at this level is something more impressive.

Sajith Perera, 13, who is in Year 8 and attends Lyndale Secondary School, came first in the 12-13 year-old boys 400m and 90m Hurdles with a near record breaking time of 13.94; 0.14 seconds away from the current state record of 13.80.

"It was a proud moment when I won, I was not expecting to be better than the competition at the state level", said Perera when describing his win at the state meet.

In October, at the Southern Metropolitan Regional meet, Sajith had broken the regional record and his personal best with his personal best time of 13.20.

The event hosted by School Sports Victoria two weeks ago at the Lakeside stadium in Albert Park was the first state level competition for Pererabut is undoubtedly not to be his only. Sajith's Goal is to break both the Hurdles and 400m records and in the future to become a national athlete and one day represent Australia.



**Heenatigala Indrawansha Thero**
is a creative artist who illustrates the buddhism in Modern Art.

## The Buddhist Society for Youths

Youth Eye Buddhist Society is a vision of Heenatigala Indrawansha Thero to form Buddhist youths from all around the country to practice Buddhism and apply it to day to day life. You can join with Youth Eye Buddhist Society and be a part of our family. You will be notified about our latest events and projects.

You will be able to share your thoughts directly with Heenatigala Indrawansha Thero for our future projects. Your participation can make a real change in modern youth Buddhist society. People tend to believe Buddhism is practiced by seniors. Most youths are not much interested in participating religious events. Our aim is to make a social buzz with Buddhist youths how Buddhism can apply to their lives.

Visit http://www.buddhistyouth.us/ and help this project




**Contact Details**
Ven.Indrawanasha Thero,  Sri Bodirukkaramaya, Boyawalana, Alawwa. Mobile: 0711142478 Email: info@buddhistyouth.us